**15-12-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ දැන් ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික අභ්‍යාසය ඉගෙනගනිමින් සිටිනවා. මෙම අභ්‍යාසය තුළින් ඔබ විමුක්ති දේශයට, නිහඬ දේශයට යයි.

**ප්‍රශ්නය:** පරම පියා ඔය දරුවන්ව උත්සාහ දැරීමට දිරිමත් කරයි, නමුත් ඔබ දැඩි සේ විදිමත් විය යුත්තේ කුමන කාරණය පිළිබඳවද?

**පිළිතුර:** ඔබ තමන් ජීවාත්මයක් බව සලකා, පරමාත්ම පියාගේ සිහිපත් කිරීමේ සිට, ඔබගේ සම්පූර්ණ උරුමය හිමි කර ගැනීමෙන්, පැරණි ලෝකය ගිණි ගැනීමට පෙර, සූදානමින් සිටීම සඳහා, ඔබ දැඩි සේ විදිමත් විය යුතුයි. ඔබ අසමත් නොවිය යුතුයි. ශිෂ්‍යයින් අසමත් වන විට, ඔවුන් බොහෝ පසුතැවිලි වෙයි, මන්ද ඔවුන් සම්පූර්ණ වසරම අපතේ හැර ඇති බව ඔවුන්ට හැඟෙන නිසා. සමහරුන් පවසන්නේ: මා ඉගෙන නොගත්තාට මක් වෙනවද? කෙසේවෙතත්, ඔබ බොහෝ සෙයින් විදිමත් විය යුතුයි. ගුරුවරයාට, ඔබට මෙසේ පැවසීමට සිදු නොවිය යුතුයි: ප්‍රමාද වැඩියි!

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා, මෙම ආධ්‍යාත්මික පාසැලේදී ඔය ආධ්‍යාත්මික දරුවන්ට උපදෙස් ලබා දෙයි. එසේ නැත්නම්, ගුරුවරුන් උපදෙස් ලබා දී, අභ්‍යාස උගන්වන ආකාරයෙන්, ඔහු ඔය දරුවන්ට අභ්‍යාසයක් උගන්වන බව කිව හැක. මෙම ආධ්‍යාත්මික පියාද ඔය දරුවන්ට ඍජුවම පවසයි. ඔහු ඔබට පවසන්නේ කුමක්ද? මන්මනභව! ඔවුන් ‘කරුණාකර අවධානයෙන් සිටින්න!’ යැයි පවසන ආකාරයෙන්ම, පරම පියා පවසන්නේ මන්මනභව! මෙය සෑම කෙනෙක්ම තමන්ටම කාරුණික වීම වැනිය. පියා පවසන්නේ දරුවනි, නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න! අශරීරික වන්න! මෙම ආධ්‍යාත්මික අභ්‍යාසය ඔය ජීවාත්මයන්ට උගන්වන්නේ ආධ්‍යාත්මික පියා පමණයි. ඔහු පරම ගුරුවරයා වන අතර ඔබලා සහකාර ගුරුවරුන්ය. ඔබත් සෑම කෙනෙකුටම පවසන්නේ තමන් ජීවාත්මයක් බව සලකා, පරමාත්ම පියාව සිහිපත් කරන්න. ඔබ, ජීවාත්ම අවධානයට පත් වේවා! මෙයත් ‘මන්මනභව’ හි අරුත වෙයි. ඔහු උපදෙස් ලබා දෙන්නේ දරුවන්ගේ යහපතටයි. ඔහු කිසි කෙනෙක් ගෙන් ඉගෙනගෙන නැත. අන් සෑම ගුරුවරයෙක්ම යමෙකුගෙන් ඉගෙනගෙන, ඉන්පසුව අන් අයට උගන්වයි. එම කෙනා කිසිම පාසැලක ආදියේ ඉගෙනගෙන නැත. ඔහු උගන්වන්නේ ඔබට පමණයි. ඔහු පවසන්නේ මා ඔය ජීවාත්මයන්ට ආධ්‍යාත්මික අභ්‍යාසය උගන්වමි. අන් සෑම කෙනෙක්ම භෞතික දරුවන්ට, භෞතික අභ්‍යාස උගන්වයි. ඔවුන් එම අභ්‍යාස සිදු කළ යුත්තේ ඔවුන්ගේ භෞතික සිරුරු වලිනි. මෙහිදී, සිරුරක් පිළිබඳ ප්‍රශ්නයක් නැත. පරම පියා පවසන්නේ මට සිරුරක් නැත. මා ඔබට අභ්‍යාසය කියා දී, ඔබට උපදෙස් ලබා දෙනවා පමණයි. නාටකයේ සැලසුමට අනුව, මෙම අභ්‍යාසය ඉගැන්වීමේ කොටස ඔහු තුළ පටි ගත වී තිබේ. මෙම සේවය ඔහු තුළ පටිගත වී තිබේ. ඔහු පැමිණෙන්නේ අභ්‍යාසය ඉගැන්වීම සඳහා පමණයි. ඔබ තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් බවට පරිවර්ථනය විය යුතුයි. මෙය ඉතාමත්ම පහසුයි. ඔබගේ බුද්ධිය තුළ ඉනිමග තිබේ. ඔබ උපත් 84 හි චක්‍රය වටා ගොස් පහළට පැමිණි ආකාරය ගැන ඔබ දන්නවා. පරම පියා පවසන්නේ ඔබ දැන් ආපසු නිවසට යා යුතුයි. වෙනත් කිසිම කෙනෙක් ඔහුගේ අනුගාමිකයන්ට හෝ ශිෂ්‍යයන්ට මෙසේ නොකියයි ඕ ආධ්‍යාත්මික දරුවනි, ඔබ දැන් ආපසු නිවසට යා යුතුයි. ආධ්‍යාත්මික පියා හැර වෙනත් කිසිවෙකුට මෙය විස්තර කළ නොහැක. ඔබ දැන් ආපසු නිවසට යා යුතු බව, ඔය දරුවන්ට වැටහෙයි. මෙම ලෝකය දැන් තමෝප්‍රධාන්ය. අපි සතෝප්‍රධාන් ලෝකයේ අධිපතියන්ව සිටි අතර, දැන් උපත් 84 හි චක්‍රය වටා යෑමෙන් පසුව, තමෝප්‍රධාන් ලෝකයේ අධිපතියන් බවට පත්ව සිටියි. මෙහි වෙන දෙයක් නැත, තිබෙන්නේ දුකම පමණයි. පරම පියාට, දුක නැති කරන්නා සහ සතුට පිරිනමන්නා යැයි කියයි, එනම් තමෝප්‍රධාන් අයව සතෝප්‍රධාන් බවට පත් කරවන්නේ ඒකායන පියා පමණයි. ඔබ බොහෝ සතුට අත්වින්ද බව ඔය දරුවන්ට වැටහෙයි. ඔබ රාජධානිය පාලනය කළ අන්දම ඔබට මතක නැති වුවත් ඔබගේ අරමුණ සහ ඉලක්කය, ඔබ ඉදිරියේ ඇත. එය මල් උයනයි. අපි දැන් කටු වලින් මල් බවට පරිවර්ථනය වෙමින් සිටිනවා. විශ්වාසය ඇති කරගන්නේ කෙසේද කියා ඔබ අසන්නේ නැත. ඔබට කිසියම් සැකයන් තිබේ නම්, ඔබ විනාශය කරා යයි. ඔබ මෙම පාසැලෙන් ඉවතට පියවර තැබූ විට, ඔබගේ ඉගෙනුම නතර වෙයි. එවිට ඔබගේ තත්ත්වය විනාශ වී, විශාල පාඩුවක් සිදුවෙයි. ඔබගේ තත්ත්වය පුරවැසියන් අතරේද බොහෝ පහත් වෙයි. ප්‍රධානතම දෙය වන්නේ සතෝප්‍රධාන්, පිදුම් ලබන්නට සුදුසු දේවතාවන් වීමය. ඔබ දැන් දේවතාවන් නොවෙයි. ඔය බ්‍රහ්මනයන්ට දැන් වැටහීම ලැබී

තිබේ. පැමිණ, පරම පියාගෙන් මෙම අභ්‍යාසය ඉගෙනගන්නේ බ්‍රහ්මනයින් පමණයි. අභ්‍යන්තරයේ ඔබට සතුටද තිබේ. ඔබ මෙම ඉගෙනුමට කැමති නේද? මේවා පරමාත්ම දෙවියන්ගේ වදන්ය. ඔවුන් ක්‍රිෂ්ණාගේ නම ඇතුලත් කළ නමුත්, ක්‍රිෂ්ණා, මෙම අභ්‍යාසය ඉගැන්වූයේ නැති බව ඔබට වැටහෙනවා. මෙය උගන්වන්නේ පරම පියා පමණයි. විවිධ නම් සහ ස්වරූප ගැනීමෙන් තමෝප්‍රධාන් බවට පත්ව ඇති ක්‍රිෂ්ණාගේ ජීවාත්මයටද ඔහු උගන්වනවා. පරම පියා කිසිදාක මෙය ඉගෙනගන්නේ නැත අන් සෑම කෙනෙක්ම අනිවාර්යෙන්ම තව කෙනෙක්ගෙන් ඉගෙනගනී. එම කෙනා ඔබට උගන්වන ආධ්‍යාත්මික පියාය. ඔහු ඔබට උගන්වන අතර, ඔබ ඉන්පසුව අන් අයට උගන්වයි. උපත් 84 ක් ගැනීමෙන් ඔබ අපවිත්‍ර වී ඇති අතර, ඔබ දැන් පිවිතුරු විය යුතුයි. මේ සඳහා ආධ්‍යාත්මික පියාව සිහිපත් කරන්න. භක්ති මාර්ගයේදී ඔබ මෙසේ ගායනා කරමින් සිටියා අහෝ පාරිශුද්ධකරුවාණෙනි! දැන් වුවද ඔබට ඕනෑම තැනකට ගොස් මෙය සිදුවන ආකාරය දැක ගත හැක. ඔබ රාජ ඍෂිවරුන්ය ඔබට ගොස් ඕනෑම තැනක සංචාරය කළ හැක ඔබට කිසිම බන්දනයක් නැත. අසීමිත පියා ඔබට සේවය කිරීමට පැමිණ ඇත, යන විශ්වාසය ඔය දරුවන්ට තිබේ. මෙම ඉගෙනුම සඳහා, පියා දරුවන්ගෙන් ගාස්තුවක් අය කරන්නේ කෙසේද? ගුරුවරයෙකුගේ දරුවෙක්, ඔහුගේ ශිෂ්‍යයා නම්, ඔහු, ඔහුට නොමිලේ උගන්වනු ඇත. එම කෙනාද ඔබට නොමිලේ උගන්වයි. ඔබ යමක් දෙන බව නොසිතන්න. ඒවා ගාස්තු නොවෙයි. ඔබ කිසිවක් නොදෙයි ඔබ ඒ වෙනුවට විශාල වශයෙන් ගනී. මිනිසුන් දන් දී පුණ්‍යකර්ම සිදු කරන්නේ, ඔවුන්ගේ මතු භවයෙදී එහි ඵලය ලැබෙයි කියා ඔවුන්ට හැඟෙන බැවින්ය ඔවුන්ට තාවකාලික සතුටක් ලැබෙයි. ඔවුන්ගේ මතු භවයෙදී ඔවුන්ට යමක් ලැබෙන නමුත්, ඔවුන්ට එය ලැබෙන්නේ, ඔවුන් පහළට යන උපතකදීය ඔවුන් දිගින් දිගටම ඉනිමග දිගේ පහළට යයි. ඔබ දැන් කුමක් කළත්, එය ඉහළ නැඟීමේ තත්ත්වයට යෑම වෙනුවෙනි. මිනිසුන් කර්මයේ ඵලය ගැන කතා කරයි. කර්මයේ ඵලය ලබන්නේ ජීවාත්මයි. ලක්ෂ්මී සහ නාරායන් ද ඔවුන්ගේ කර්මයේ ඵලය ලැබුවා, එහෙම නේද? ඔබට අසීමිත පියාගෙන් අසීමිත ඵල ලැබෙයි. අනෙක ලැබෙන්නේ චක්‍රානුසාරයෙනි. මෙය නාටකයේ නියම වී තිබේ. මෙයත් පෙර නියම වී තිබෙන නාටකයයි. චක්‍රයකට පසුව, ඔබ අසීමිත පියාගෙන් ඔබගේ උරුමය හිමි කරගන්නා බව ඔබ දන්නවා. පරම පියා මෙතැන අසුන් ගෙන, අපට පාසැලක් නිර්මාණය කරනවා. ඔබ චක්‍රයෙන් භාගයක්ම බොහෝ විවිධ අන්දමින් ඉගෙනගත්, ලෞකික පාසැල් එම රජයට තිබේ. ඔබගේ සියලු දුක් උපත් 21 කට ඉවත් කිරීම සඳහා පරම පියා දැන් ඔබට උගන්වනවා. එහි තිබෙන්නේ රාජධානියක්. එහි සෑම කෙනෙක්ම අංකානුසාරයි, මෙහිද සෑම කෙනෙක්ම අංක පිළිවෙලට සිටින ආකාරයෙන්ම ඔබට රජුන්, රැජිනියන්, උපදේශකවරුන්, පුරවැසියන් ආදිය සිටියි. මෙය පැරණි ලෝකයයි. නව ලෝකයේ ඉතාමත්ම සුළු මිනිසුන් සංඛ්‍යාවක් සිටිවි. එහි බොහෝ සතුට තිබෙයි. ඔබ ලෝකයේ පාලකයන් බවට පත් වෙමින් සිටිනවා. අධිරාජවරුන් සහ රජවරුන් සිටි අතර, දැන් නොමැත. මිනිසුන් බොහෝ සතුටින් සමරයි. කෙසේවෙතත්, පරම පියා පවසන්නේ ඒ වුවද ඔවුන් පහළට වැටිය යුතුයි. සෑම කෙනෙක්ම වැටිය යුතුයි. දේවතාවන්ගේ අංශකද ක්‍රම ක්‍රමයෙන් අඩුවන නමුත්, එහි රාවනගේ රාජධානිය නොපවතින බැවින්, තිබෙන්නේ සතුටම පමණයි. මෙහි එය රාවනගේ රාජධානියයි. ඔබ ඉහළ නඟින ආකාරයෙන්ම ඔබ පහළටද වැටෙයි. ජීවාත්ම, විවිධ නම් සහ රූප සාදාගෙන පහළට බසී. නාටක සැලසුමට අනුව, ඔවුන් පෙර චක්‍රයේ වැටුණු එම ආකාරයෙන්ම, තමෝප්‍රධාන් වී ඇද වැටී ඇත. සියලු දුක් ආරම්භ වන්නේ ඔවුන් රාගයේ කොත මතට නඟින විටයි. දැන් අන්ත දුක තිබේ. එහි අන්ත සතුට තිබෙයි. ඔබ රාජ ඍෂිවරුන්ය. ඔවුන්ට තිබෙන්නේ හඨයෝගාවයි. ඔවුන්ට නිර්මාණයේ මුල, මැද සහ අවසානය පිළිබඳ ඥානය තිබේද කියා ඕනෑම කෙනෙක් ගෙන් විමසන්න, එවිට ඔවුන්ට එය නොමැති බව පිළිතුරු දෙයි. මෙය වැටහෙන අයට පමණයි, වෙන අයගෙන් එය විමසිය හැක්කේ. තමන්ම මෙය නොදන්නා කෙනෙක්, තවත් කෙනෙකුගෙන් එය විමසන්නේ කෙසේද? කිසිම මුනිවරයෙක් හෝ ඍෂිවරයෙක් ආදිය, ත්‍රිකාලදර්ශී නොවූ බව ඔබ දන්නවා. පරම පියා අපව ත්‍රිකාලදර්ශී බවට පත් කරවනවා. ලෝකයේ අධිපතිව සිටි මෙම බාබාට මෙම ඥානය තිබුණේ නැත. මෙම උපතේ වුවත් 60 වන විය තෙක්, ඔහුට මෙම ඥානය නොතිබිණි. පරම පියා පැමිණි පසුවත්, ඔහු ක්‍රම ක්‍රමයෙන්, වරකට ඥානය ටිකින් ටිකයි පැවසුවේ. බොහෝ දෙනෙක් ඔවුන්ගේ බුද්ධිය තුළ ස්ථිර විශ්වාසය ඇති කරගන්නා නමුත්, මායා නොකඩවා ඔවුන්ව පහළට ඇද වට්ටවයි. ඔවුන්ගේ නම් ඔබට කීමට බාබාට නොහැක. එසේ කළොත් ඔවුන් අධෛර්යමත් වෙයි. බාබාට සියලුම පුවත් ලැබෙනවා. ඇතැම් විට ඔවුන් නරක අයව ආශ්‍රය කරයි. ඇතැම් විට ඔවුන් මෑතක විවාහ වුණු අයව ආශ්‍රය කරන අතර, බාධා ඇතිවෙයි. එවිට ඔවුන්ට විවාහ නොවී සිටීමට නොහැකි බව ඔවුන් පවසයි. දිනපතාම පංතියට ගිය, එමෙන්ම මෙහි මධුබාන් වලට බොහෝ වාර ගණනක් පැමිණි, හොඳ මහාරතී කෙනෙක්, කිඹුලා වන මායාට හසු විය. එවන් බොහෝ අවස්ථාවන් දිගටම සිදුවෙනවා. ඔවුන් තවමත් විවාහ වී නොමැති නමුත්, මායා ඔවුන්ව ඇගේ කටේ දමා ඇති

අතර, හිමින් සීරුවේ ඔවුන්ව ගිලගන්නවා. ගැහැණියකගේ ස්වරූපයෙන් මායා ඔවුන්ව ඇදගනී. ඔහු කිඹුලාගේ කටට වැටී ඇත. ඉන්පසුව ක්‍රම ක්‍රමයෙන් ඇය ඔහුව සම්පූර්ණයෙන්ම ගිල දමයි. ඇතැම් අය අතින් වැරදි සිදුවෙයි එසේ නැත්නම් කෙනෙක් දුටු සැනින් පමණක් දඟකාරකම් සිදුවෙයි. ඔවුන් උඩ ඉහළ සිට, වළේ ගැඹුරටම වැටෙන බව ඔවුන්ටද වැටහෙයි. එම දරුවා ඉතා හොඳ වූ නමුත්, එම දුගී අසරණ කෙනා, දැන් අවසන් වී ඇති බව කියයි! විවාහ ගිවිස ගත් සැනින් ඔහු මියැදෙයි. පරම පියා නිරතුරුවම දරුවන්ට ලියයි ඔබ සෑම විටෙකම ජීවතුන් අතර සිටිත්වා! ඔබ ඉතා දරුණු අන්දමින් මායාගේ පහරට ලක් නොවන බවට වගබලා ගන්න. මෙම සමහර දේවල් ගැන ග්‍රන්ථ වල සඳහන් වී ඇත. වර්තමානයේ සිදුවන දේවල් පසු කලකදී සිහි කෙරෙයි. ඔබ දිගින් දිගටම ඔවුන්ට උත්සාහ දරන ලෙස දිරිමත් කළ යුතුයි. කිඹුලා වන මායා, ඔවුන්ව ගිල නොදැමිය යුතුයි. මායා ඔවුන්ව බොහෝ විවිධ ආකාරයෙන් හසු කරගනී. ප්‍රධානතම දෙය වන්නේ, ඔබ බොහෝ ප්‍රවේසම් විය යුතු, රාගයයි. අපවිත්‍ර ලෝකය, පිවිතුරු වන ආකාරය ඔබට දැක ගැනීමට පුළුවනි. මෙය ගැන අවුලට පත් වීමට දෙයක් නැත. තමන් ජීවාත්මයක් බව සලකා, පරමාත්ම පියා සිහිපත් කිරීමෙන්, සියලු දුක් ඉවත්ව යයි. පාරිශුද්ධකරු වන්නේ පරම පියාම පමණයි. යෝගාවේ බලය මෙයයි. භාරතයේ පෞරාණික රාජයෝගාව බොහෝ සුප්‍රසිද්ධයි. ක්‍රිස්තුස් වහන්සේට වසර 3000 කට පෙර, පාරාදීසිය පැවතුණු බව, ඔවුන් විශ්වාස කරයි. එබැවින් නිසැකයෙන්ම වෙනත් ආගම් නොතිබිණි. මෙය ඉතාමත් පහසු කාරණාවක් වුවත් ඔවුන්ට එය නොවැටහෙයි! එම රාජධානිය ස්ථාපිත කිරීමට පරම පියා නැවත පැමිණ ඇති බව ඔබ දන්නවා. ශිව බාබා වසර 5000 කට පෙරද පැමිණියා. ඔහු දැන් ලබා දෙන එම ඥානයම ඔහු අනිවාර්යෙන්ම ලබා දෙන්නට ඇති. පරම පියාම පවසන්නේ මා සෑම චක්‍රයකම සංගම යුගයෙදි සාමාන්‍ය සිරුරකට පැමිණෙන්නේ ඔබට රාජයෝගාව ඉගැන්වීමටයි. ඔබ රාජ ඍෂිවරුන්ය. ඔබ පෙර එය නොවීය. බාබා පැමිණි කාලයේ සිටම ඔබ බාබා සමගම සිට ඇත. ඔබ ඉගෙනගන්නා අතර, සේවයද කරයි භෞතික සේවය මෙන්ම සූක්ෂම සේවය. භක්ති මාර්ගයේද මිනිසුන් සේවය කරන අතර ඔවුන්ගේ ගේදොරවල් ද රැකබලා ගනී. පරම පියා පවසන්නේ දැන් භක්තිය අවසන් වී ඇති අතර, ඥානය ආරම්භ වී ඇත. මා පැමිණෙන්නේ ඔබට ඥානය තුළින් විමුක්තිය ලබා දීමටයි. බාබා ඔබව පිවිතුරු කරවන බව, ඔබගේ බුද්ධිය තුළ තිබේ. පරම පියා පවසන්නේ නාටකයට අනුව, ඔබට මාර්ගය පෙන්වීමට මා පැමිණ ඇත. ගුරුවරයා ඔබට උගන්වන අතර, ඔබගේ අරමුණ සහ ඉලක්කය ඔබ ඉදිරියේ ඇත. මෙය උසස්ම උසස් ඉගෙනුමයි. ඔහු පෙර චක්‍රයේ විස්තර කළ දේවල්ම ඔහු දිගින් දිගටම ඔබට විස්තර කරයි. නාටකය, අඛණ්ඩව ගෙවී යයි. තත්පරයෙන් තත්පරයට සිදුවන සෑම දෙයක්ම සිදු වී ඇති අතර, එය නැවතත් වසර 5000 කට පසුව ඒ ආකාරයෙන්ම සිදුවෙයි. දවස් දිගටම ගත වී යයි. මෙම සිතිවිලි වෙනත් කිසිම කෙනෙකුගේ බුද්ධියට ඇතුළු වන්නේ නැත. ස්වර්ණමය, රිදී, තඹ සහ කලි යුග, දැන් ගෙවී ගොස් ඇති අතර, ඉන්පසුව ඒවා නැවතත් සිදුවෙයි. පෙර චක්‍රයේදී පසුවුණු සෑම දෙයක්ම දැන් නැවතත් පසු වී ගෙන යයි. ඉතිරිව තිබෙන්නේ දින කිහිපයක් පමණයි. ඒ මිනිසුන් වසර සිය දහස් ගණනක් ගැන කතා කරයි. ඒ හා සසඳන විට, ඔබ කියන්නේ ඉතිරිව තිබෙන්නේ තව පැය කිහිපයක් පමණක් බවයි. මෙයද නාටකයේ නියම වී තිබේ. සෑම දෙයක්ම ගිණි ගන්නා විට, මිනිසුන් අවදි වෙයි. ඒ වෙලාවෙදී එය ප්‍රමාද වැඩි වනු ඇත! එබැවින් පරම පියා දිගින් දිගටම ඔබට උත්සාහ දරන්නට දිරිමත් කරයි. සමුපූර්ණයෙන්ම සූදානමින් අසුන් ගෙන සිටින්න, එපමණයි. එය ප්‍රමාද වැඩි බව, ගුරුවරයාට ඔබට කියන්නට සිදු නොවිය යුතුයි! ඔවුන්ට හැඟෙන්නේ ඔවුන්ගේ මුළු වසරම ඔවුන් අපතේ හැර ඇති බවයි. සමහරුන් පවසන්නේ මා ඉගෙන නොගත්තාට කුමක් වෙයිද? ඔය දරුවන් බොහෝ විදිමත්ව සිටිය යුතුයි ‘මම පරම පියාගෙන් සම්පූර්ණ උරුමයම හිමි කරගන්නවා.’ තමන් ජීවාත්මයක් බව සලකා, පරමාත්ම පියා සිහි කරන්න. ප්‍රධානතම දෙය මෙයයි. පරම පියා ඔබට වසර 5000 කට පෙරද පැවසුවේ නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න! පාරිශුද්ධකරු මමයි. සියල්ලන්ගේම පියා මමයි. ක්‍රිෂ්ණා සියල්ලන්ගේ පියා නොවෙයි. ඔබට ශිවාගේ සහ ක්‍රිෂ්ණාගේ වන්දනාකරුවන්ට මෙම ඥානය ලබා දිය හැක. ජීවාත්ම කිසි දිනෙක පිදුම් ලබන්නට සුදුසු වී නොමැති නම්, ඔබ කෙතරම් වෙහෙස වුවත්, ඔවුන්ට නොවැටහෙයි. ඔවුන් දැන් අදේවවාදීන්ය. විටෙක අනාගතයේදී ඔවුන් දේවවාදීන් වනු ඇත. නිදසුනක් ලෙස, කෙනෙක් විවාහ වී ඇද වැටී, ඉන්පසුව පැමිණ ඥානය ලබා ගැනීමට පුළුවනි. කෙසේවෙතත්, ඔහුගේ උරුමය බොහෝ අඩු වනු ඇත, මන්ද, ඔහුගේ බුද්ධිය තුළ වෙනින් කෙනෙකුගේ සිහිපත් කිරීම තිබෙන නිසා. එය ඉවත් කිරීම ඉතා අපහසුයි. පළමුව ඔහුගේ බිරිඳගේ සිහි කිරීමත් ඉන්පසුව දරුවන්ගේ සිහිකිරීමත් තිබේ. දරුවන්ට වඩා බිරිඳ වෙනුවෙන් වැඩි ආකර්ෂණයක් තිබෙයි, මන්ද, එම සිහිකිරීම බොහෝ කාලයක් තිබී ඇති නිසා දරුවන් පැමිණෙන්නේ පසුවයි. තවද මිතුරන්, නෑදැයින්, නැන්දා මාමා ආදීන්ගේ සිහිකිරීමද තිබෙයි. පළමුව තිබෙන්නේ, බොහෝ කාලයක් සහකරුව සිට ඇති, බිරිඳගේ සිහිකිරීමයි. මෙහිද සිදුවන්නේ එයමයි.

ඔබ දේවතාවන් සමග බොහෝ කාලයක් සිට ඇති බව, ඔබ පවසයි. එසේ නම්, ඔබ බොහෝ කාලයක්, ශිව බාබා කෙරෙහි විශාල සෙනෙහසක් තිබී ඇති බවත් ඔබ කිව යුතුයි. ඔහු වසර 5000 කට පෙරත් අපව පිවිතුරු කළා. ඔහු සෑම චක්‍රයකදීම පැමිණ අපව ආරකෂා කරයි, මේ නිසයි ඔහුට දුක නැති කරන්නා සහ සතුට පිරිනමන්නා කියා කියන්නේ. ඔබට බොහෝ පැහැදිලි රේඛාවක් තිබිය යුතුයි. පරම පියා පවසන්නේ ඔබගේ දෑසින් දැකිය හැකි සෑම දෙයක්ම සොහොන් බිමේ වැලලී යැමටයි තිබෙන්නේ. ඔබ දැන් සිටින්නේ සංගම යුගයේය. අමරණීය දේශය පැමිණෙන්නට යනවා. අපි දැන් වඩාත්ම ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයන් වීමට උත්සාහ දරමින් සිටිනවා. මෙය වඩාත්ම ශ්‍රේෂ්ඨ, ශුභදායක, යහපත ගෙනෙන සංගම යුගයයි. පිටත මුළු ලෝකයේම සිදුවන දේ ඔබට දැකගත හැක. පරමාත්ම පියා දැන් පැමිණ ඇත. එබැවින් පැරණි ලෝකය විනාශ විය යුතුයි. ඔබ තව දියුණුවත්ම, බොහෝ දෙනෙක් මේ පිළිබඳ දැනුවත් වෙයි. ලෝකය පරිවර්ථනය කරන කෙනෙක් අනිවාර්යෙන්ම පැමිණ ඇත. මෙය, එම මහා භාරත යුද්ධයමයි. ඔබ බොහෝ නුවණැත්තන් බවට පත් වනවා! මෙම දේවල් ඉතා ගැඹුරින් කැලතිය යුතුයි. ඔබගේ හුස්ම අපතේ නොහැරිය යුතුයි. මෙම ඥානය තුළින්, සෑම හුස්මක්ම වටිනා බවට පත් වන බව ඔබ දන්නවා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. මායාගෙන් ආරක්ෂිතව සිටීමට, ඔබ තබන ආශ්‍රය ගැන බොහෝ ප්‍රවේසම් වන්න. බොහෝ පැහැදිලි රේඛාවක් තබාගන්න. ඔබගේ හුස්ම අපතේ නොහරින්න, ඒ වෙනුවට ඥානය තුළින් එය වටිනා බවට පත් කරවාගන්න.
2. යෝගා බලය රැස් කරගැනීම සඳහා ඔබට තිබෙන සෑම වේලාවකදීම ආධ්‍යාත්මික සරඹය අභ්‍යාස කරන්න. දැන් කිසිම නව බන්දනයක් සාදා නොගන්න.

**වරදානය:** පරමාත්ම පියාගේ ආරක්ෂක වියන යටතේ සිටීම අත්විඳීමෙන් බාධක විනාශ කරන්නෙකුගේ උපාධිය ලබා ගැනීමටත්, එමඟින් අත්දැකීම් වල ප්‍රතිමූර්තියක් වීමටත් ඔබට හැකි වේවා.
පරමාත්ම පියා ඔබ සමඟ සිටින විට, කිසිවෙකුට ඔබට කිසිවක් කළ නොහැක. ඔහුගේ ඇසුරේ අත්දැකීම ආරක්ෂක වියනක් බවට පත් වේ. බාප්දාදා සෑම විටම තම දරුවන් ආරක්ෂා කරයි. පරීක්ෂණ පත්‍රිකා පැමිණෙන්නේ ඔබව අත්දැකීම් ඇති අය කරවීමටයි, එබැවින් සෑම විටම එම පත්‍රිකාව පැමිණ ඇත්තේ ඔබට ඊළඟ පන්තියට යාමට බව සිතන්න. මෙයින් ඔබ බාධක විනාශ කරන්නෙකුගේ උපාධිය ලබා ගන්නා අතර සෑම විටම අත්දැකීම් වල ප්‍රතිමූර්තියක් වීමේ ආශිර්වාදය ලබා ගනී. මිනිසුන් දැන් ටිකක් ශබ්ද නැඟුවා නම් හෝ බාධකයක් නිර්මාණය කළේ නම්, ඔවුන් ක්‍රම ක්‍රමයෙන් සිසිල් වනවා ඇත.

**පාඨය:** අවශ්‍ය වෙලාවට සහයෝගී වන අයට එකකට මිලියන ගුණයක ප්‍රතිලාභයක් ලැබේ.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

දැකීම, සවන් දීම සහ කතා කිරීම යන ක්‍රියා කිරීම පහසු වී ඇති ආකාරයටම, කර්මතීත් වීමේ අවධිය අත්විඳින්න, එනම්, ඔබේ බලය භාවිත කර, ඕනෑම ක්‍රියාවක බලපෑමෙන් ඔබ්බට ගිය කෙනෙකු වන්න. එකක් ක්‍රියාව මත යැපීමේ අවධිය වන අතර අනෙක කර්මතීත් අවධියයි, එනම්, ක්‍රියා කෙරෙහි අධිකාරියක් ඇති අවධියයි. එබැවින්, ඔබේ රාජකීය ක්‍රියාකාරකම්, ජීවාත්මයේ ස්වයං ස්වෛරීභාවය, ඔබේ භෞතික ඉන්ද්‍රියන් ජයග්‍රහණය, ඔබේ නියෝග යටතේ ක්‍රියාත්මක වන බව පරීක්ෂා කරන්න.